# 06.වාර්ෂික සැලැස්මේ එළඹුම් ක්ෂේත්‍ර යටතේ සිදු කළ සුවිශේෂ වැඩසටහන්-2025

## 6.1.Thrust Area -01

මෙම එළඹුම් ක්ෂේත්‍රය භාරව කටයුතු කරනු ලබන්නේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ හිමාලි පතිරණ මිය වේ.නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය සඳහා සම සහභාගීත්වය සහ සාධාරණ ප්‍රවේශ වැඩි දියුණු කිරීම, නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පාසල්වල ආරක්ෂිත හා ආකර්ශනීය ඉගෙනුම් පරිසරයක් සහතික කිරීම, සිසුන්ගේ පෝෂණ සහ සෞඛ්‍ය තත්ත්ව වැඩි දියුණු කිරීම සහ වෘත්තිය මාර්ගෝපදේශනය සහ උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙ යටතේ සිදු වේ.

2025 වර්ෂය සදහා CF සහ GEMP ප්‍රතිපාදන යටතේ මූල්‍ය ප්‍රතිපාදන මෙම එළඹුම් ක්ෂේත්‍රයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පහත පරිදි ලැබුණි.

**CF මූල්‍ය ප්‍රතිපාදන Thrust Area -1**

| No | Activity | Allocation | Total Expenditure | Expenditure % | Physical Progress % | Remarks |
|---|---|---|---|---|---|---|
| 1 | Non Formal Education | 0.045 | 0.028410 | 63.13 | 69.23 | |
| 2 | Health & Nutrition programs | 0.03 | 0.00 | 0 | 0 | |

මේ යටතේ නොවිධිමත් අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි

**GEMP මූල්‍ය ප්‍රතිපාදන Thrust Area -1 (NDLI -3)**

| No | Activity | Allocation | Total Expenditure | Expenditure % | Physical Progress % | Remarks |
|---|---|---|---|---|---|---|
| 1 | SPECIAL EDUCATION | 0.04 | 0.033040 | 82.6 | 83.33 | |
| 2 | Health & Nutrition programs | 0.18 | 0.164080 | 91.16 | 88.6 | |
| 3 | Implementation CG & Counseling | 0.08 | 0.058190 | 72.74 | 89.1 | |
| 4 | හදිසි ආපදා තත්ත්ව යටතේ මනෝ විද්‍යා උපදේශන | 0.0619 | 0.030235 | 48.84 | 48.60 | |

මීට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදි.

**CG මූල්‍ය ප්‍රතිපාදන Thrust Area -1 (NDLI -3)**

| No | Activity | Allocation | Total Expenditure | Expenditure % | Physical Progress % | Remarks |
|---|---|---|---|---|---|---|
| 1 | ලෝක ආහාර සංවර්ධන වැඩසටහන | 0.15 | 0.074331 | 49.55 | 100 | |

නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම යටතේ සමස්ථයක් ලෙස සිසුන් 7610කට නිල ඇඳුම් ලබා දීම ද , පාසල් 33 ක පාසල් පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම 2025 වර්ෂයේ දී සිදු කරන ලදි.

පාසල් වල ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න පරිසරයක් නිර්මාණය කිරීම වස් අධ්‍යාපන ප්‍රාග්ධන වත්කම් නඩත්තු වැඩසටහන යටතේ පාසල් දොළහක (12) ගොඩනැගිලි අලුත්වැඩියාවන් සිදු කරන ලදි. එමෙන්ම පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පාසල් 06ක සහ කලාප අධ්‍යාපන කාර්යාල සඳහා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක විය. එමෙන්ම පාසල් 03ක් සඳහා ජල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක විය. නාගල විද්‍යාලය සඳහා විදුලි අලුත්වැඩියා ව්‍යාපෘතියක් අනුමතව පැවතියක් දිට්වා සුලිකුණාටුවේ බලපෑම හේතුවෙන් විදුහලේ කටයුතු පවත්වා ගෙන යාමට නොහැකි තත්ත්වයක් සිදු වූ බැවින් ව්‍යාපෘතිය 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක නොවීය.





### 6.1.1 PSDG ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද කර්මාන්ත

PSDG ව්‍යාපෘතිය යටතේ කර්මාන්ත 10 ක් සිදු කළ අතර ඒ සඳහා රුපියල් මිලියන 15.21ක මුදලක් වෙන් කළ අතර රුපියල් 12453253.72 මූල්‍ය ප්‍රගතියක් අත්කර ගන්නා ලදී. මෙහි දී නව සනීපාරක්ෂක පද්ධති ඉදිකිරීම සහ අලුත්වැඩියාව , ජල පහසුකම් වැඩි දියුණුව සිදු කරන ලදි



**නිකුල බිබිල ක.වි ඒකක දෙකක සනීපාරක්ෂක පද්ධති ඉදිකිරීම -අවසන් 100% මිලියන1.14**



**පිළිහුඩුගොල්ල ක.වි ඒකක එකක සනීපාරක්ෂක පද්ධති ඉදිකිරීම අවසන් 100% මිලියන 0.82**



රත්තොට මහාබෝධි ක.වි ඒකක 04ක සනීපාරක්ෂක පද්ධති ඉදිකිරීම

මිලියන 2.5

වැඩ අවසන් 100%





**ඕපල්ගල ක.වි ජල පහසුකම් වැඩි දියුණුව**
**මිලියන -01**
**අවසන් 100%**

## 6.1.2 අධ්‍යාපන නඩත්තු වැඩසටහන යටතේ සිදු කරන ලද කර්මාන්ත

අධ්‍යාපන නඩත්තු වැඩසටහන යටතේ කර්මාන්ත 12 ක් සිදු කළ අතර එහි දි මිලියන 2ට අඩු කර්මාන්ත 7ක් සහ මිලියන 2-5ත් .අතර කර්මාන්ත 05ක් ලෙස කර්මාන්ත ක්‍රියාත්මක විය. මේ සඳහා රුපියල් මිලියන 31.22ක මුදලක් වෙන් කළ අතර රුපියල් 21040320.54 මුල්‍ය ප්‍රගතියක් අත්කර ගන්නා ලදී.මෙහිදි අවදානම් තත්ත්වයේ පැවති පාසල් ගොඩනැගිලි වහල, අවදානම් බැම් සහ අත්‍යවශ්‍ය සනීපාරක්ෂක පද්ධති අලුත්වැඩියා කර ගැනීමට හැකිවිය. එමෙන්ම දිට්වා සුළි කුණාටුවේ බලපෑම මත රත්තොට මහබෝධි විද්‍යාලයේ කර්මාන්තය අවසන් කර ගැනීමට නොහැකි වූ අතර අඛණ්ඩ කර්මාන්තයක් ලෙස 2026 වර්ෂය සඳහා යොමු වන ලදි.



**නිකුල බිබිල ක.වි - 60*20 ගොඩනැගිල්ල අලුත්වැඩියාව**





පුබ්බිලිය ක.වි 80*20 ගොඩනැගිල්ල අලුත්වැඩියාව

නාලන්ද ම.වි දෙමහල් ගොඩනැගිල්ල අලුත්වැඩියාව

# Thrust Area -02

## 6.2. Thrust Area -02

මෙම එළඹුම් ක්ෂේත්‍රය භාරව කටයුතු කරනු ලබන්නේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ඉරෝෂා විරවර්ණ මෙය වේ. ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම යටතේ තිර්යයක් කුසලතා සමාජ චිත්තවේගීය කුසලතා හර අධ්‍යාපනය සහ ආචාර ධර්ම වැඩි දියුණු කිරීම ඉලක්ක කරගත් අධ්‍යාපනයට පුළුල් ප්‍රවේශයක් ලබා ගැනීම, නිපුන මිනිස් ප්‍රාග්ධනයක් සඳහා විද්‍යාව තාක්ෂණය ගණිතය ඉංග්‍රීසි අධ්‍යාපනය වැඩි දියුණු කිරීම,ගුරු සංවර්ධනය, ගුරු අධ්‍යාපන,සහ ගුරු කළමණාකරණය සහ ඩිජිටල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධනය කිරීම තුළින් ආකර්ශණීය ඉගෙනුම් පරිසරයක් ඇති කිරීම ආදී කටයුතු සිදු කරනු ලබයි.

මේ යටතේ සිදු කරන ලද ප්‍රධාන කාර්යයක් ලෙස 2024 සහ 2025 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුන් ඉලක්ක කර ගෙන සිදු කළ විශේෂ ව්‍යාපෘති වැදගත් වේ. එහි දි සමත් ප්‍රතිශතය ඉහළ දැමීම සඳහා නේවාසික වැඩමුලු සිසු සම්මන්ත්‍රණ ආදීය සිදු කරන ලදී. මේ යටතේ සිදු කළ සුවිශේෂී වැඩසටහන් අතර සිසු පෞරුෂ සංවර්ධන වැඩසටහන්, සමාජ සංහිදියා වැඩසටහන ප්‍රධාන වේ.

2025 වර්ෂය සඳහා CF සහ GEMP ප්‍රතිපාදන යටතේ මුල්‍ය ප්‍රතිපාදන මෙම එළඹුම් ක්ෂේත්‍රයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පහත පරිදි ලැබුණි.

**CF මූල්‍ය ප්‍රතිපාදන Thrust Area -2**

| No | Activity | Allocation | Total Expenditure | Expenditure % | Physical Progress % | Remarks |
|---|---|---|---|---|---|---|
| 1 | **Thrust Area -2** | 7.786 | 6.427 | 72.66 | 89.1 | |

**GEMP මූල්‍ය ප්‍රතිපාදන Thrust Area -2**

| No | Activity | Allocation | Total Expenditure | Expenditure % | Physical Progress % | Remarks |
|---|---|---|---|---|---|---|
| 1 | **Thrust Area -2** | 1.537 | 1.294 | 84.21 | 86.4 | |

**SESIP මූල්‍ය ප්‍රතිපාදන Thrust Area -2**

| No | Activity | Allocation | Total Expenditure | Expenditure % | Physical Progress % | Remarks |
|---|---|---|---|---|---|---|
| 1 | **Thrust Area -2** | 1.931 | 1.545 | 80.02 | 87.1 | |

**MOE & CG මූල්‍ය ප්‍රතිපාදන Thrust Area -2**

| No | Activity | Allocation | Total Expenditure | Expenditure % | Physical Progress % | Remarks |
|---|---|---|---|---|---|---|
| 1 | **Thrust Area -2** | 2.897 | 2.271 | 56.56 | 80.2 | |

## 6.2.1 ක්‍රියාත්මක කළ සුවිශේෂී වැඩසටහන්

### 6.2.1.1 ප්‍රාථමික විෂය විෂය සංවර්ධන සිසු පාදක සහ ගුරු පාදක වැඩසටහන්











### 6.2.1.2 දෙමළ මාධ්‍ය පාසල්වල සිදු කළ සුවිශේෂී විෂය සමගාමී සහ විෂය බාහිර ක්‍රියාකාරකම්











### 6.2.1.3 ඉංග්‍රීසි භාෂා විෂයේ සංවර්ධනය සඳහා වන ක්‍රියාකාරකම්









6.2.1.4 ප්‍රාථමික සිසුන්ගේ ප්‍රායෝගික කුසලතා සංවර්ධනය කිරීමේ, සිසු වැඩමුළු, කඳවුරු

**1.6** සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපන විෂයේ අඩු සාධන මට්ටම් සිසුන් ඉලක්ක කරගෙන ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත වැඩසටහන් පාසල් මට්ටමෙන් පැවැත්වීම.

**6.2.1.7** සෞන්දර්ය විෂයේ ප්‍රතිඵල සංවර්ධනය කිරිමේ අරමුණින් පැවැත් වු විශේෂ වැඩසටහන්

### **6.2.1.8** සංහිඳියා අවුරුදු උත්සවය





### **6.2.1.9** සිංහල භාෂාව සහ සාහිත්‍ය වැඩසටහන යටතේ සිසු නිර්මාණ ඇතුළත් පද්‍ය සංග්‍රහය එළි දැක්වීම-



නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පළමු ශ්‍රේණිය සහ 6 ශ්‍රේණියට අදාළව සිදු කළ විෂය මාලා නවීකරණය යටතේ ගුරු පුහුණුවීම් සිදු කිරීම 2025 වර්ෂයේ අග භාගයේ දී සිදු කරන ලදි. ඒ සඳහා CF සහ MOE ප්‍රතිපාදන යටතේ මුල්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලදි.

## 6.3 Thrust Area – 03 & 04C

මෙම එළඹුම් ක්ෂේත්‍ර භාරව කටයුතු කරනු ලබන්නේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සැලසුම්) ඒ.ඒ.එල්.එම් ඩයස් මහතා වේ.2025 වර්ෂය සඳහා GEMP සහ SESIP ප්‍රතිපාදන යටතේ මූල්‍ය ප්‍රතිපාදන මෙම එළඹුම් ක්ෂේත්‍රයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පහත පරිදි ලැබුණි.

**GEMP මූල්‍ය ප්‍රතිපාදන Thrust Area -3 & 4**

| No | Activity | Allocation | Total Expenditure | Expenditure % | Physical Progress % | Remarks |
|---|---|---|---|---|---|---|
| 1 | **EPSI-7** | 0.530 | 0.491 | 92.55 | 92.51 | |
| 2 | **HRD-8** | 0.150 | 0.132 | 88.39 | 65.4 | |
| 3 | **Conduct periodical plan and progress review meeting** | 0.105 | 0.850 | 80.95 | 86.2 | |

පාසල් නඟා සිටුවීම වැඩසටහන යටතේ පාසල් අතර අත්දැකීම් හුවමාරු වැඩසටහනක් මප/මහ විද්‍යාර්ථ විද්‍යාලය සමඟ සංවිධානය කළ අතර එහිදී පාසල් කළමනාකරණ ව්‍යුහය සකස් කර ගෙන ඇති ආකාරය, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පහසු කර ගැනීම උදෙසා භාවිත නව්‍ය ක්‍රමවේද පිළිබඳ දැනුමක් ඇති කර ගන්නා ලදී.









මානව සම්පත් සංවර්ධන වැඩසටහන යටතේ කලාපයේ නිලධාරීන් හට බැහැරගත පුහුණු වැඩමුලුවක් සහ නුවරඑළිය අධ්‍යාපන කාර්යාලයේ නිලධාරීන් සමඟ එලදායිතා සංකල්ප සහ කාර්යාල ක්‍රම පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීමේ වැඩමුලුවක් පවත්වන ලදී. ඒ යටතේ පහත සඳහන් අත්දැකීම් හුවමාරු සැසි පැවැත්විණි:

- **ආයතනික කළමනාකරණය හා පරිපාලනය:** ගොනු පද්ධති, ලේඛන කළමනාකරණය, කාල කළමනාකරණ ක්‍රමෝපායන් පිළිබඳ ඉදිරිපත් කිරීම.
- **ගුරු සේවය හා අධ්‍යාපන**
- **සංවර්ධනය:** ගුරු පුරප්පාඩු කළමනාකරණය, පාසල් අධීක්ෂණ ක්‍රමවේද සහ ගුණාත්මක අධ්‍යාපනය තහවුරු කිරීම සඳහා යොදා ගන්නා නව්‍යකරණයන්.
- **මානව සම්පත් කළමනාකරණය:** නිලධාරීන්ගේ අභිප්‍රේරණය (Motivation) සහ සුභසාධනය සඳහා ක්‍රියාත්මක කරන වැඩසටහන්.
- **තොරතුරු තාක්ෂණය (IT) යොදා ගැනීම:** කාර්යාලීය කටයුතු **ඩිජිටල්කරණය (Digitalization)** කිරීමේ ක්‍රමවේදයන් සහ ප්‍රතිලාභ









**SESIP මූල්‍ය ප්‍රතිපාදන යටතේ සිදු කළ ක්‍රියාකාරකම් Thrust Area -3 & 4**

| No | Activity | Allocation | Total Expenditure | Expenditure % | Physical Progress % | Remarks |
|---|---|---|---|---|---|---|
| 1 | **PLANNING** | 0.130 | 0.94492 | 72.69 | 92.02 | |

ඉහත SESIP අරමුදල් යටතේ ලැබූ ප්‍රතිපාදන මගින් පාසල්වල 2026 වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්ම සහ 2026-2030 මධ්‍යකාලීන සැලැස්ම සකස් කිරීම සඳහා වන වැඩසටහන් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක කරන ලදි.

## 07.දිට්වා සුළි කුණාටුවේ බලපෑම මත කලාපයේ පාසල්වල සිදු වූ වෙනස්කම්

2025 නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකාවට බල පෑ දිට්වා සුළි කුණාටුවේ බලපෑම මත කලාපයේ පහත පාසල් වලට හානි විය.

| | | | පාසලේ නම | ආපදාවේ ස්වභාවය |
|---|---|---|---|---|
| | පූර්ණ හානි | 1 | ගම්මඩුව දෙමළ විද්‍යාලය | ගොඩනැගිලි ආපදාවට ලක්වීම සහ නාය යෑම |
| | | 2 | නාගල දෙමළ විද්‍යාලය | පාසල පවතින ප්‍රදේශය නාය යෑම |
| | | 3 | හපුගස්පිටිය දෙමළ විද්‍යාලය | ජාතික ගොඩනැගිලි පර්යේෂණ නිර්දේශ අනුව ගොඩනැගිලි අවදානම් වීම මත හුණුකැට ඇළ ප්‍රාථමික විද්‍යාලයේ දැනට ස්ථාපනය |
| | | | | |
| | මධ්‍ය ප්‍රමාණයේ හානි | 1 | රත්තොට මහාබෝධි ම.වි | ආරක්ෂිත බැම් නාය යෑම සහ විද්‍යා කාමරය සහ පරිගණක කාමරය ඉරිතලා යෑම |
| | | **2** | කලුගල්තැන්න ප්‍රා.වි | පාසල් ගොඩනැගිලි අසල සුලු නාය යෑම් |
| | | 3 | මොන්ටිගොපල්ලව ආදර්ශ ප්‍රා.වි | ආරක්ෂිත බැම්ම කඩා වැටීම |
| | | | | |
| | සුලු ප්‍රමාණයේ හානි | 1 | නිකුල බිබිල ක.වි | ගොඩනැගිල්ලේ වහලයට සුලු ආපදා |
| | | 2 | මේල්පිටිය ම.වි | ගොඩනැගිල්ලේ වහලයට සුලු ආපදා |
| | | 3 | ඕපල්ගල දෙමළ ප්‍රා.වි | ගුරුනිවාසයේ බැම්මේ කොටසක් කඩා වැටීම |
| | | 4 | පිළිහුඩුගොල්ල ක.වි | පාසල් භූමියට සිදු වූ ආපදා තත්ත්වයන් |
| | | 5 | බොබැල්ල ප්‍රා.වි | පාසල් භූමියට සිදු වූ ආපදා තත්ත්වයන් පාසල් නාම පුවරුවට හානිවීම් තාවකාලික ගොඩනැගිලිවලට හානි වීම් |
| | | 6 | නාලන්ද සුදර්ශි ප්‍රා.වි | ගොඩනැගිලි අසල ගල් බැම්ම ට සුලු හානි වීම |
| | | 7 | කුඹල්ඔලුව ක.වි | පාසල් භූමිය සෙල්ලම් මිදුලට සුලු හානි වීම් |
| | | 8 | පුස්සැල්ල නවෝදයා පාසල | ක්‍රීඩා පිටිය අසල කොටස ගොඩනැගිලි අසල කොටස්වල සුලු ආපදා තත්ත්වයන් |





මෙම තත්ත්වය හේතු කොට ගෙන ගම්මඩුව දෙමළ විද්‍යාලය, නාගල දෙමළ විද්‍යාලය වසා දමා නව පාසලක් ලෙස ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. මේ සඳහා මාතලේ දිස්ත්‍රික් ලේකම්ගේ අංක DSM/PLN/07/08 සහ 2026-04-17 දිනැති ලිපිය අනුව මෙම පාසල් දෙක ඒකාබද්ධ කර සිසුන් 500කට සරිලන ලෙස 1-C පාසලක් ලෙස ඉදිකිරීමට අඹන්ගඟකෝරලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සෙංගසාඩි නම් ස්ථානයේ ඉඩමක් තෝරාගෙන ඇති බවත්, ඉඩම පවරා ගැනීමට දැනට ඉඩමේ අයිතිය පවතින රාජ්‍ය වැවිලි සංස්ථාවේ සභාපති වෙත අංක MP & CI /03/DISASTER HOUSING /2025/VOL -4 සහ 2026-03-11 දිනැති ලිපිය මගින් ඉල්ලුම් කර ඇති බව දැනුම් දී ඇත. ඉදිකිරීම සඳහා Rebuilding Srilanka වැඩසටහන යටතේ රුපියල් මිලියන 250ක් වෙන් කරන ලදි.

**එමෙන්ම හපුගස්පිටිය දෙමළ විද්‍යාලය** පැවති භූමියේ අස්ථාව- රතා සහ අවදානම සම්බන්ධව ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මගින් නිකුත් කළ අංක NBRO /LRRMD-MAT/MTL/AMBANK/LI/25/077 නිර්දේශ අනුව හුණුකැට ඇළ ප්‍රාථමික විද්‍යාල භූමියේ . (04168) දැනට මෙම පාසල ස්ථාපනය කර ඇත. (හුණුකැට ඇළ ප්‍රාථමික විද්‍යාලයේ සිසුන් අඩුවීම මත දැනට ප්‍රාථමික පාසල් ප්‍රතිසංවිධානය වැඩසටහන යටතේ මප/නා මොන්ටිගොපල්ලව ආදර්ශ ප්‍රාථමික විද්‍යාලය හා ඒකාබද්ධ කර ඇත.

## 08.ප්‍රාථමික පාසල් ප්‍රතිසංවිධාන වැඩසටහන

රජයේ ප්‍රතිපත්තිමය තීරණය අනුව ප්‍රාථමික පාසල් ප්‍රතිසංවිධාන වැඩපිළිවෙල මෙම වර්ෂයේ සිට ආරම්භ විය. මේ යටතේ පහත පරිදි පාසල් ප්‍රතිසංවිධානය කිරීමට තීරණය විය

නාඋල අධ්‍යාපන කොට්ඨාසයේ පාසල් 23ක සිසුන් 5849 සහ ගුරුභවතුන් 438ක් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරතව සිටියි. නාඋල අධ්‍යාපන කොට්ඨාසයේ පාසල් වර්ගීකරණය වී ඇති ආකාරය පහත පරිදි වේ.

| අනු අංකය | පාසල් වර්ගය | පාසල් සංඛ්‍යාව | | | සිසුන් 100ට අඩු පාසල් |
|---|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | මුලු එකතුව | |
| **01** | **1 AB** | 01 | 00 | 01 | 00 |
| **02** | **1 C** | 05 | 01 | 06 | 00 |
| **03** | **Type 2** | 08 | 01 | 09 | 06 |
| **04** | **Type 3** | 07 | 00 | 07 | 04 |
| | එකතුව | **21** | **02** | **23** | **10** |

මෙම පාසල් 23 අතරින් 2 වර්ගයේ පාසල් 06ක් සහ 3 වර්ගයේ පාසල් 04ක් වශයෙන් පාසල් 10ක සිසුන් 100ට අඩු ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටියි. (2025- 06-01 දිනට ලබා ගත් ශිෂ්‍ය සංඛ්‍යා අනුව

<u>වසා දැමීමට යෝජිත පාසල්</u>

| අනු අංකය | පාසල් සංගණන අංකය | පාසල | වර්ෂය | ශිෂ්‍ය සංඛ්‍යාව | යෝජනාව |
|---|---|---|---|---|---|
| 01 | **04106** | මප/නා මුරුතෝලුව ක.වි | 2026 | 44 | කිලෝමීටර් 3.5ක් ආසන්නයේ පවතින මප/නා මේල්පිටිය ම.විද්‍යාලයට(04099) යොමු කිරීම. |
| 02 | **04108** | මප/නා හාඩුව ක.වි | 2026 | 51 | ප්‍රාථමික අංශය මප/නා බොබැල්ල ප්‍රාථමික විද්‍යාලයට (04335) සහ ද්විතියික අංශය ශ්‍රී නාග ජාතික පාසලට යොමු කිරීම (04093) |
| 03 | **04112** | මප/නා ඕපල්ගල මොරගොල්ල ම.වි | 2026 | 10 | සිසුන් කිලෝමීටර් 4ක් ආසන්නයේ පවතින මප/නා මොන්ටිගොපල්ලව මහා විද්‍යාලයට (04094) යොමු කිරීම |
| 04 | **04111** | මප/නා උඩුදෙනිය ප්‍රා.වි | 2027 | 44 | මෙම පාසලට ආසන්නයේ පවතින්නේ නාලන්ද සුදර්ශි ප්‍රාථමික විද්‍යාලය (04336) ට සිසුන් යොමු කිරීම |

**ද්විතියික අංශය වසා දමා ප්‍රාථමික පාසලක් ලෙස සංවර්ධනය කිරීමට යෝජිත පාසල්**

| අනු අංකය | පාසල් සංගණන අංකය | පාසල | වර්ෂය | ශිෂ්‍ය සංඛ්‍යාව | යෝජනාව |
|---|---|---|---|---|---|
| 05 | **04105** | මප/නා පිළිහුඩුගොල්ල ක.වි | 2027 | 96 | අකරහඩුව වැනි දුෂ්කර ග්‍රාමයන්ගේ සිට සිසුන් පැමිණේ. සිසුන්ට ඍජු ප්‍රවාහන පහසුකම් නොමැත. එබැවින් ප්‍රාථමික පාසලක් ලෙස සංවර්ධනය කර ද්විතියක අංශය නාලන්ද ම.විද්‍යාලය වෙත යොමු කිරීම |

**සිසුන් 100ට අඩු සංවර්ධනය කර පවත්වාගෙන යාමට යෝජිත පාසල්**

| අනු අංකය | පාසල් සංගණන අංකය | පාසල | ශිෂ්‍ය සංඛ්‍යාව | යෝජනාව |
|---|---|---|---|---|
| 06 | 04113 | මප/නා දෙවරාදපොල ප්‍රා.වි | 86 | නගරබද ප්‍රතිරෝදය අවම කිරීම සඳහා පවතින පාසලවේ. ආසන්නයේ පවතින පාසල්වලට යොමු කිරීමේ අපහසුව මත පාසල පවත්වාගෙන යාම. |
| 07 | 04109 | මප/නා බඹරගහවත්ත ප්‍රා.වි | 52 | වන අලින් ආදීය ගැවසෙන බැවින් සිසුන්ගේ ආරක්ෂාව උදෙසා පාසල පවත්වාගෙන යාම. |
| 08 | 04107 | මප/නා බෝගස්බොබැල්ල ක.වි | 74 | කිලෝමීටර් අටක් පමණ ආසන්නයේ වෙනත් පාසලක් නොමැති බැවින් ප්‍රවාහන දුෂ්කරතා ද පවතියි එබැවින් පාසල පවත්වා ගෙන යාම. වන අලින්ගේ තර්ජණ ද පවතියි. |
| 09 | 04102 | මප/නා ඔපල්ගල ක.වි | 54 | හුදෙකලා පාසලකි. ප්‍රවාහන දුෂ්කරතා ද පවතින බැවින් පාසල පවත්වාගෙන යාම සුදුසුය. |
| 10 | 04282 | මප/නා අල්හම්රා මුස්ලිම් ක.වි | 53 | ආසන්නයේ දෙමළ මාධ්‍යය පාසලක් නොමැති බැවින් පාසල පවත්වාගෙන යාම |

අඹන්ගඟකෝර්ලය අධ්‍යාපන කොට්ඨාසයේ පාසල් 16ක සිසුන් 1850ක් සහ ගුරුභවතුන් 235ක් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරතව සිටියි. අඹන්ගඟකෝර්ලය අධ්‍යාපන කොට්ඨාසයේ පාසල් වර්ගීකරණය වී ඇති ආකාරය පහත පරිදි වේ.

මෙම පාසල් 16 අතරින් 2 වර්ගයේ පාසල් 05ක සහ 3 වර්ගයේ පාසල් 05ක සිසුන් 100ට අඩු ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටියි. (2025-ජුනි මස 01දින ලබා ගත් ශිෂ්‍ය සංඛ්‍යා අනුව

**වසා දැමීමට යෝජිත සිසුන් 100 ට අඩු පාසල්**

| අනු අංකය | පාසල් සංගණන අංකය | පාසල | වර්ෂය | ශිෂ්‍ය සංඛ්‍යාව | යෝජනාව |
|---|---|---|---|---|---|
| 01 | 04168 | මප/නා හුණුකැටඇළ ප්‍රා.වි | 2025 | 06 | සිසුන් කි.මී 3ක් ආසන්නයේ පවතින මප/නා මොන්ටිගොපල්ලව ආදර්ශ ප්‍රාථමික විද්‍යාලයට (04332) යොමු කිරිම. |
| 03 | 04292 | මප/නා ඕපල්ගල දෙමළ ප්‍රා.වි | 2026 | 40 | සිසුන් කි.මී 3ක් ආසන්නයේ පවතින මප/නා ගම්මඩුව දෙමළ මහා විද්‍යාලයට (04291) යොමු කිරිම |
| 04 | 04161 | මප/නා කලුගල්තැන්න ප්‍රා.වි | 2026 | 24 | සිසුන් කිලෝමීටර් 3ක් ආසන්නයේ ඇති පුස්සැල්ල නවොදයා පාසලට යොමු කිරිම. |
| 05 | 04163 | මප/නා පල්ලේතැන්න ක.වි | 2026 | 87 | එබැවින් සිසුන් හුණුකැටේ ප්‍රාථමික විද්‍යාලයට යොමු කිරීම සුදුසු වේ. |

**සිසුන් 100ට අඩු සංවර්ධනය කර පවත්වාගෙන යාමට යෝජිත පාසල්**

| අනු අංකය | පාසල් සංගණන අංකය | පාසල | ශිෂ්‍ය සංඛ්‍යාව | යෝජනාව |
|---|---|---|---|---|
| 06 | 04159 | මප/නා ඉඹුල්ගොල්ල ප්‍රා.වි | 57 | පවතින භූගෝලීය තත්ත්වයන් මත සිසුනට වෙනත් පාසල්වලට ළඟා වීමට අපහසු බැවින් පාසල පවත්වාගෙන යාම |
| 07 | 04167 | මප/නා හුණුකැටේ ක.වි | 98 | පල්ලේතැන්න ක.වි 6-9 සිසුන් මෙම පාසලට ඇතුළත් වීමෙන් පසුව 100ට අඩු ළමුන් සීමාව ඉක්මවා යයි. |
| 08 | 04305 | මප/නා හපුගස්පිටිය දෙමළ ක.වි | 56 | සිසුන් යොමු කළ හැකි වෙනත් දෙමළ මාධ්‍යය පාසලක් නොමැති බැවින් පාසල පවත්වාගෙන යාම |
| 09 | 04309 | මප/නා විග්නේශ් වරා ප්‍රා.වි | 29 | හුදෙකලා පාසලකි ප්‍රවාහන දුෂ්කරතා ද පවතින බැවින් පාසල පවත්වාගෙන යාම සුදුසුය |
| 06 | 04310 | මප/නා පල්ලේතැන්න දෙමළ ක.වි | 56 | ප්‍රදේශයේ පවතින දුෂ්කරතාවය අනුව දෙමළ මාධ්‍ය පාසලක් ලෙස පවත්වාගෙන යාම සුදුසුය |

අධ්‍යාපන අමාත්‍යාංශ ය මගින් ඉහත වැඩසටහන යටතේ 2026 වර්ෂය සහ 2027 වර්ෂය සඳහා පහත පාසල් සංවර්ධනය කිරීම සඳහා පහත පාසල් තොරා ගෙන ඇත.

| | SCHOOL NAME | Project year | DIVISION |
|---|---|---|---|
| 1 | MONTIGOPALALWA MODEL P.S | 2026 | ABANGANAGA - KORALAYA |
| 2 | MONTIGOPALLLWA M.V | 2027 | NAULA |






## 09.2025 වර්ෂයේ මුල්‍ය සහ භෞතික සමස්ථ ප්‍රගතිය

| | ලැබුණ මුදල | වියදම | ඉතිරිය | % | වැඩසටහන් සංඛ්‍යාව | කැඳවූ සංඛ්‍යාව | පැමිණි සංඛ්‍යාව | % |
|---|---|---|---|---|---|---|---|---|
| CF | 7.785772 | 5.657231 | 2.128541 | 72.66 | 200 | 15066 | 13430 | 89.1 |
| GEMP | 1.536900 | 1.294269 | 0.242631 | 84.21 | 64 | 3390 | 2929 | 86.4 |
| SESIP | 1.931126 | 1.545281 | 0.385845 | 80.02 | 30 | 809 | 705 | 87.1 |
| CG | 4.015230 | 2.271006 | 1.473200 | 56.56 | 42 | 1569 | 1258 | 80.2 |
| TOTAL | 15.269028 | 10.767787 | 4.230217 | 70.52 | 336 | 20834 | 18322 | 87.9 |

## 10. ප්‍රතිඵල විශ්ලේෂණය.


10.1 ශිෂ්‍යත්ව ප්‍රතිඵල

| වර්ෂය | පෙනී සිටි සිසුන් සංඛ්‍යාව | ලකුණු 70ක් හෝ ඊට ඉහළින් ලකුණු ලබාගත් සිසුන් ගණන | % | ලකුණු 100 ක් හෝ ඊට ඉහළින් ලකුණු ලබා ගත් සිසුන් සංඛ්‍යාව | % | කඩඉම් ලකුණු ඉක්මවූ සිසුන් සංඛ්‍යාව | % | ලකුණු 70 ට අඩු ලකුණු ලබාගත් සිසුන් සංඛ්‍යාව | % |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2018 | 705 | 616 | 87.4 | 473 | 67.1 | 46 | 6.5 | 89 | 12.6 |
| 2019 | 755 | 645 | 85.4 | 465 | 61.6 | 54 | 7.2 | 110 | 14.6 |
| 2020 | 673 | 615 | 91.4 | 491 | 73.0 | 64 | 9.5 | 58 | 8.6 |
| 2021 | 706 | 606 | 85.8 | 413 | 58.5 | 93 | 13.2 | 100 | 14.2 |
| 2022 | 662 | 594 | 89.7 | 473 | 71.5 | 75 | 11.3 | 68 | 10.3 |
| **2023** | **739** | **626** | 84.7 | **460** | 62.2 | **91** | 12.3 | **113** | 15.3 |
| 2024 | 697 | 612 | 87.8 | 456 | 65.42 | 101 | 14.4 | 85 | 12.1 |
| **2025** | **644** | **523** | 81.21 | **352** | 54.65 | **106** | 16.45 | **121** | 18.78 |





## 10.2 අ.පො.ස සාමාන්‍ය පෙළ ප්‍රතිඵල

| වර්ෂය | විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව | උසස් පෙළ සඳහා සුදුසුකම් ලත් සංඛ්‍යාව | % | ගණිතය සහ පළමු බස විෂය සහිතව සමත් සංඛ්‍යාව (විෂයයන් 6 ක් සහ සම්මාන 3ක් සහිතව) | % | විශිෂ්ට සමාර්ථ 9 සහිතව සමත් සිසුන් සංඛ්‍යාව | සියලුම විෂයයන් අසමත් සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| 2017 | 543 | 366 | 67 | 309 | 57 | 1 | 19 |
| 2018 | 522 | 363 | 70 | 335 | 64 | 0 | 13 |
| 2019 | 568 | 403 | 71 | 349 | 61 | 5 | 12 |
| 2020 | 584 | 433 | 74 | 355 | 61 | 1 | 4 |
| 2021 | 589 | 459 | 78 | 386 | 66 | 3 | 7 |
| 2022 | 565 | 429 | 75 | 362 | 64 | 0 | 6 |
| 2023 | 614 | 410 | 67 | 410 | 67 | 0 | 3 |
| 2024 | 611 | 455 | 74 | 382 | 62 | 7 | 2 |




## 10.3 අ.පො.ස උසස් පෙළ ප්‍රතිඵල විශ්ලේෂණ

| වර්ෂය | විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව | විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව | % | සියළුම විෂයයන් අසමත් සිසුන් සංඛ්‍යාව | A-3 PASS |
|---|---|---|---|---|---|
| 2017 | 204 | 117 | 57 | 27 | |
| 2018 | 230 | 131 | 57 | 23 | |
| 2019 | 265 | 140 | 53 | 19 | |
| 2020 | 278 | 167 | 60 | 20 | |
| 2021 | 296 | 174 | 59 | 31 | |
| 2022 | 295 | 196 | 66 | 27 | |
| 2023 | 343 | 212 | 61 | 37 | |
| 2024 | 282 | 160 | 56 | 27 | 03 |
| 2025 | 352 | 184 | 52 | 00 | 03 |




## 11.විෂයානුබද්ධ හා විෂය බාහිර ක්‍රියාකාරකම් යටතේ ජයග්‍රහණ

| තරඟ අංශය | තරඟ ඉසව්ව | පාසල | ස්ථානය |
|---|---|---|---|
| සෞන්දර්ය - සංගීත | හර්මෝනියම් ගී අනුවාදන (පිරිමි) | කුඹියන්ගහඇළ ප්‍රා.වි | ප්‍රථම |
| සෞන්දර්ය - සංගීත | ඒකල හර්මෝනියම් වාදනය | R.A.M.P රණසිංහ | හතරවන |
| සෞන්දර්ය - සංගීත | හිංදි චිත්‍රපටි ගීත | මොන්ටිගොපල්ලව ම.වි | සහභාගීත්ව සහතික |
| සෞන්දර්ය - සංගීත | දැල් ගී ස්වතන්ත්‍ර නිර්මාණ | නිකුල බිබිල ක.වි | සහභාගීත්ව සහතික |
| සෞන්දර්ය - නර්ථන | ශිර්ෂාභරණ කට්ටල නිර්මාණය | H.M.P.R.N හේරත් - මොන්ටිගොපල්ලව ම.වි | තෙවන |
| සිංහල භාෂා සාහිත්‍ය තරඟ | ගේය පද රචනා ජාතික මට්ටම | මප/නා පුස්සැල්ල නවෝද්‍යා පාසල -කේ.පි.එන්.ඩි පතිරණ | දෙවන |
| සිංහල භාෂා සාහිත්‍ය තරඟ | පද්‍ය නිර්මාණ - 7 ශ්‍රේණිය | මප/නා මහින්ද ද්විතියික පාසල යූ.පී.එස් ලෙහංසි | තුන්වන ස්ථානය |
| සිංහල භාෂා සාහිත්‍ය තරඟ | පද්‍ය නිර්මාණ 12-13 ශ්‍රේණිය | මප/නා මහින්ද ද්විතියික විද්‍යාලය කේ.ජී.එච්.බී.කේ කුමාරසිරි | තුන්වන ස්ථානය |
| සිංහල භාෂා සාහිත්‍ය තරඟ | භාෂා භාවිතය 7 ශ්‍රේණිය | මප/නා නිකුල බිබිල ක.වි ජී.පී.එස්.ඩි නුරන්දි ගන්නිලේ | දෙවන ස්ථානය |
| සිංහල භාෂා සාහිත්‍ය තරඟ | අත් අකුරු 7 ශ්‍රේණිය | මප/නා නිකුල බිබිල ක.වි ජී.පී.එස්.ඩි නුරන්දි ගන්නිලේ | තෙවන ස්ථානය |
| සිංහල භාෂා සාහිත්‍ය තරඟ | ගේය පද රචනා 10 ශ්‍රේණිය | මප/නා පුස්සැල්ල නවෝද්‍යා පාසල -කේ.පි.එන්.ඩි පතිරණ | ප්‍රථම ස්ථානය |
| සිංහල භාෂා සාහිත්‍ය තරඟ | කෙටි කතා 11 ශ්‍රේණිය | මප/නා මහින්ද ද්විතියික පාසල කේ.ජී.එල්.එස් ගුණවර්ධන | හතරවන ස්ථානය |
| සිංහල භාෂා සාහිත්‍ය තරඟ | ගේය පද රචනා 11 ශ්‍රේණිය | මප/නා නිකුල බිබිල ක.වි ඊ.එම්.එච්.ඊ ඒකනායක | හතරවන ස්ථානය |
| සිංහල භාෂා සාහිත්‍ය තරඟ | ගේය පද රචනා 12/13 ශ්‍රේණිය | මප/නා ආදාවල ම.වි පි.ජී. සුභානි නවෝද්‍යා | හතරවන ස්ථානය |
| සිංහල භාෂා සාහිත්‍ය තරඟ | පද්‍ය ගායනා 8 ශ්‍රේණිය | මප/නා නාලන්ද ම.වි එස්.ඩබ්.එස්.බි ජයසේකර | ප්‍රථම ස්ථානය |
| සිංහල භාෂා සාහිත්‍ය තරඟ | පද්‍ය ගායනා 7 ශ්‍රේණිය | මප/නා හාඩුව ක.වි ඒ.එම්.කේ.ජී.එම්.ඩි අත්තනායක | හතරවන ස්ථානය |
| ක්‍රීඩා | හැන්ඩ් බෝල් | ශ්‍රී නාග ජාතික පාසල | ප්‍රථම ස්ථානය |

## 12. 2025 වර්ෂයේ සමස්ථ මූල්‍ය ප්‍රගතිය

| | 2025<br>මධ්‍යම රජය | 2025 පළාත් සභා |
|---|---|---|
| වර්ෂය සඳහා ලැබීම් | 142632780.18 | 1030203199.42 |
| වර්ෂය සඳහා වියදම් | 140492473.53 | 877853556.58 |
| ඉතිරිය | 2140306.65 | 154349642.84 |
| % | **98.49** | **85.05** |

## 13. පෞද්ගලික ලිපිගොණු සම්බන්ධ ක්‍රියාකාරකම් -2025

| | |
|---|---|
| වැටුප් වර්ධක ලබා දීම් | 745 |
| උසස්වීම් ලබා දීම් | 83 |
| විශ්‍රාම ගැන්වීම් | 21 |
| විදේශ නිවාඩු සකස් කිරීම් | 02 |
| නව පත්වීම් සඳහා පෞද්ගලික ලිපිගොණු සකස් කිරීම් | 52 |

## 13.1 පෞද්ගලික ලිපිගොණු සහ ඒ හා සම්බන්ධ වෙනත් ක්‍රියාකාරකම් -2025

| | |
|---|---|
| ගුරු හිඟ වැටුප් සකස් කිරීම | 162 |
| ගුරු වැටුප් වර්ධක  කිරීම | 800 |
| විනය පරීක්ෂණ | 05 |
| විගණන විමසුම් පිළිතුරු ලබා දීම් | 15 |

## 14.ඉදිරි ඉලක්ක අරමුණු

- 2029 jk úg mdi,aj,ska w'fmd'i' ^id'fm'& úNd.h i|yd bosrsm;ajk isiqkaf.a සමත් m%;ශතය 90% ඉක්මවා වැඩිකිරීම මඟින් uOHu m<d; Y%S ,xldfõ m<d;a fm<.eiafï m%:u ia:dkhg f.k tau සඳහා දායකවීම
- නාඋල අධ්‍යාපන කලාපයේ mdi,aj, YsIH idOkh yd ;lafiarelrKh i|yd úêu;a ix;;sl we.hSï l%shdj,shla ia:dmkh lsrSu
- YsIHhd ksjerosj yÿkdf.k l%shdjg kxjk m%;sld¾h bf.kqï l%shdj,s u.ska wOHdmkh i|yd jeh lrk m%;smdok M,odhS f,i fhdod.ekSu හා tu.ska YsIHhd wfmalaIs; idOkh lrd l%ñlj f.khk ixialD;shla කලාපයේ ishළු mdi,aj, mj;ajd .eksug u.fmkaùu.
- w'fmd'i'^id'fm'& úNd.fha m%;sM, ixj¾Okh u.ska mdi, flf¾ iudc úYajdih ;yjqre lsrSu yd tu.ska m%cdj ;=< mdi, wdl¾IKSh wOHdmk uOHia:dkhla njg m;alsrsu.
- w'fmd'i'^id'fm'& fukau w'fmd'i'^W'fm'& úIh Odrdjka yodrK ish,q isiqka ;=< mdi, flf¾ úYajdih f.dv kexùu yd isiqkaf.a oskm;d mdi,a meñKSu by< kexùu.
- mdi,a kshduk l%shdj,sh Yla;su;a lsrSu.
- .=re" úÿy,am;s yd ks,Odrs ld¾hidOk we.hSu w¾:j;a f,i l%shd;aul lsrSu.

## 15. ඒ සඳහා හඳුනාගත් ක්‍රියාමාර්ග

- විභාග සමත්වීම ඉහළ නැංවීම හා පාසල ආකර්ෂණීය ස්ථානයක් බවට පත්කිරීම මඟින් පාසල කෙරේ විශ්වාසය ගොඩනැඟීම හා එමඟින් දිනපතා පාසල් පැමිණීමට සිසුන් පෙළඹවීම
- විභාග සමත් කිරීමට සමගාමීව පාසල් සිසුන් තුළ අනෙකුත් කුසලතා සංවර්ධනය කිරීම
- පාසල් කාලය ක්‍රියාකාරී ලෙස ඉගෙනුම් කටයුතුවල නිරතවීමට අවශ්‍ය පසුබිම සකස්කිරීම හා සෑම ඉගෙනුම් ක්‍රියාකාරකමක් සමඟ දැනුමට අමතරව ආකල්ප සංවර්ධනය සහ ජීවන අත්දැකීමක් ලබාදීම කෙරේ ගුරු අවධානය යොමු කිරීම
- පාසල විසින් පාසලේ විශිෂ්ට ව්‍යවහාර, කාර්යසාධන දර්ශක හා අගයන් සමාජගත කිරීම
- 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහනේ පළමු වසරට අදාල විෂය නිර්දේශය සාමාන්‍ය පෙළ විභාගයට පෙනීසිටි සියලු සිසුන් සඳහා ක්‍රියාත්මක කිරීම
- පාසල්වල ගුරු අවශ්‍යතා සපුරාලීම හෝ සපුරා ගැනීමට ක්‍රමවේද සකස් කිරීම
- ගුරු භවතුන් සඳහා ඵලදායී ලෙස ගුරු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

## 13. ඇමුණුම්

2. 2025 ගිණුම් වැය විස්තර වැය ශිර්ෂ අනුව

3. 2025-12-31දිනට CF,GEMP, ,SESIP වැඩසටහන්වල ප්‍රගතිය

4. 2025 නඩත්තු අලුත්වැඩියා ඉදිකිරීම් ප්‍රගතිය